Addem: C. L. O.

(15)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 20.05.2020

ලේකම්,

සෞඛ්‍ය අමාත්‍යතාංශය,

සුවසිරිපාය,

බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය - එච්.ආර්.සී./841/20</u>

කොවිඩ් 19 ආසාධනය වීමෙන් මියගිය පුද්ගලයන්ගේ මෘත දේහ ආදාහනය කිරීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබී ඇති පැමිණිලි සම්බන්ධයෙන් වාර්තාවක් 2020.05.06 වන දිනට පෙර ඉදිරිපත් කරන ලෙස 2020.04.29 වන දින ඔබ වෙත යොමුකර ඇතත් එම වාර්තාව මෙතෙක් අප වෙත ලැබී නොමැති අතර එම වාරතාව 2020 .05.22 දිනට පෙර අප වෙත යොමු කිරීමට සලස්වන්නේ නම් මැනවි.

තවද,

කොළඹ 15, මෝදර පදිංචි මොහොමඩ් ශාෆික් යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2020.05.10 වන දින පැමිණිල්ලක් යොමු කර ඇත.

එකී පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරුගේ බිරිද වන ෆාතිමා රිනෝෂා යන අය මියගොස් ඇති බවත් ඇයට කොරෝනා වෛරසය ආසාධනයවී නොමැති බවත් එහෙත් ඇයගේ මල සිරුර සෞඛ්‍ය බලධාරීන් විසින් බලහත්කාරයෙන් ආදාහනය කර ඇති බවත්ය.

මෙම කාරණය පිළිබඳ පරීක්ෂා කර ඉදිරි කටයුතු සඳහා මියගිය පුද්ගලයාගේ මරණ පරීක්ෂණ වාර්තාව, කොවිඩ් 19 ආසාධනය වී ඇති බවට හෝ එසේ නොමැති බව සනාථ කිරීමට අදාළ වාර්තාව ඇතුලත් සවිස්තර වාර්තාවක් 2020.06.15 දිනට පෙර මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිමි. ( අදාළ පැමිණිල්ලේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.

සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74

ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.con

දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82

ලේකම් / செயலாளர் / Secretary: 011-2505521

ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996

වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

මෙම දැන්වීම දැක්වීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව බව කරුණාවෙන් සලකන්න.

ලේකම්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත - සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
සුවසිරිපාය,
බත්තරමුල්ල.

FAXED
Tele. No 2692913
2693869
Date 20/05/20 Time 12:45 p.m